# දෙදෙනෙක්




කුමන ආකාරයෙන් සිදු වුවද ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකකි. මෑත කාලයේදී මට හමුවූ මා දන්නා හඳුනන ලේඛකයන් දෙදෙනෙක් අප හැරදා ජීවිතයෙන් සමුගත්හ. ඔවුහු ලේඛන කලාව තුලින් බොහෝ දුර ගමනක් ආ කෘතහස්ත, ප්‍රතිභාපූර්ණ ලේඛකයන් දෙදෙනෙකි. ඒ ජගත් රණතුංග හා චන්ද්‍රසිරි දොඩංගොඩයි. ඔවුන් දෙදෙනා කවියෙන් ලේඛන කලාවට අවතීර්ණව, පුවත්පත්හි විශේෂාංග කතුවරුන් වූහ. එසේම පාඨක සිත් සතන් බැඳ තබාගත්, කාව්‍ය ග්‍රන්ථ, කෙටි කතා නවකතා වැනි ග්‍රන්ථ රාශියක් ශ්‍රී ලාංකික පාඨක ප්‍රජාවට තිළිණ කළ ප්‍රවීන ලේඛක දෙපළක් වූහ. එයින් දොඩංගොඩයන් ප්‍රමුඛය. ඔවුන් දෙදෙනාම මිය ගියේ ජීවිතයෙන් සමුගන්නා සිටින වයසක නොවේ. ඉන් පෙරය. එහෙත් ජීවිතයේ අනිත්‍ය බව පසක් කරමින්, යා යුතු කළ යා යුතුමයි යන වදන සිහි කරමින් ඔවුන් අද නික්ම ගොසිනි.

ජගත් රණතුංග නම් ලේඛකයා මා දැන හඳුනාගත්තේ අප අතරින් වියෝවූ සුප්‍රකට ජනමාධ්‍යවේදියෙකු වූ ඇස්. පියසේන මහත්මා හරහාය. මගේ හුස්ම කෙටිකතා සංග්‍රහය ජගත් අතට ගියේ පියසේන මහත්මා අතිනි. ඔහු ලංකාදීප විමංසා තීරයට හුස්ම ගැන විචාරයක් ලිවීය. එම විචාරය තුළින් ඔහු හුස්ම දුටුවේ ගත යුත්තක් නැති කෙටි කතා සංග්‍රහයක් ලෙසය. එහි කිසිම සාර්ථක කෙටි කතාවක් නොමැති බවත් යන්තම් හෝ සාර්ථකත්වයට ළංවී ඇත්තේ බැම් නැමැති කෙටි කතාව බවත් ලියා තැබූ හේ අවසානයේ එහි සඳහන් කර තිබුණේ මෑතකදී මා ප්‍රවීන ලේඛකයෙකුගේ කෙටි කතා සංග්‍රහයක් කියවා අවසන් වූ හෙයින් හුස්ම ලේඛකයාගේ නම මා ඉදිරියේ තබමිනි. ඔහු එදිනද වරදවාගත් බව මට වැටහිනි. අප දෙදෙනා දෙවිදියකට හිතන පතන, තම අත්දැකීම් දෙවිදියකට ප්‍රතිනිර්මාණය කරන ආධුනික හා ප්‍රවීන ලේඛකයන් දෙදෙනෙකු බව ඔහුට පසුවද නොවැටහී තිබිණි. ඔහු පෙරවදනක් ලිවීම ප්‍රතික්ෂේප කළ විට මම ප්‍රවීන ගත් කතුවර ගුණදාස අමරසේකර මහත්මා මුණ ගැසී පිටපත බාරදී පෙරවදනක් ලියා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටියෙමි. ගුණදාස අමරසේකරයන් මට පෙරවදනක් ලියා දුන්නා පමණක් නොව එහි ගුණාගුණ පෙන්වා සාර්ථක, අසාර්ථක තැන් පහදා දී එහි කෙටිකතා කිහිපයක් ගැන විශේෂ ඇගයීමක් ද කළේය. ජගත් එදා එසේ නොකරන්නට මට අමරසේකරයන් මුණ ගැසෙන්නේ නැත. එහෙයින් ජගත්ගේ දෙවෙනි මුණ ගැසීම හා විචාරයට මම අදත් ගරු කරමි.

චන්ද්‍රසිරි දොඩංගොඩයන් මට හමුවෙන්නේ බත්මුල කෙටි කතාව හරහාය. මම බත්මුල දිවයින ඉරිදා සංග්‍රහට යැවීමි.

පොතේ නම පරාරෝපණය නොවී සරල නමක් යෙදුවානම් හොඳ බවත් පැවසීය.

එම දැන හඳුනාගැනීම තුලින් ඔහුගේ පුත් නිපුන දොඩංගොඩ මට මුණගැසිණි. නිපුන මෙරටට පැමිණියේ වැඩිදුර අධ්‍යාපනය සඳහාය. ඔහු මා නිර්මාණය කළ හුස්ම කෙටි



කෙටි කතා සංග්‍රහය අසාර්ථක කෘතියක් ලෙසින් තමාට දැනුණු බවත්ය. එය කියවූ පියසේන මහත්මා ඔහු වරදවාගත් තැන එතැන බැව් මා සමඟ පැවසුවේය.

"මං මිනිහගෙ අතට පොත දුන්නේ මේක ආධුනිකයෙකුගෙ නිර්මාණයක්. විචාරයක් ලියනකොට ඒ ගැනත් හිතන්න කියලා." පියසේන මහත්මා මට පැවසුවේය. එහෙත් එම නිර්දය විචාරය මම සතුටින් බාරගතිමි. එලෙසින් හෝ ජාතික පුවත්පතක මාගේ නිර්මාණයක් විචාරයට බඳුන් වීම මගේ සතුටට කාරණයක් විය. විචාරයට මම ස්තූතිය පුද කළෙමි. එයින් පසු මා ඔහු සමඟ සම්බන්ධකම් පැවැත්වූයේ දුරකථනය හරහාය. ඒ දැන හඳුනාගැනීම මත මා ලංකාවට ගිය අවස්ථාවේ ඔහු මුණ ගැසී මගේ ඊළඟ කෙටි කතා සංග්‍රහය වූ ප්‍රතිමාවක් සංක්‍රමණිකයෙක් සහ දරුවෙක් පිටපත කියවා පෙරවදනක් ලියා දෙන මෙන් කාරුණික ඉල්ලීමක් කළේය. එහෙත් ඔහු එයට එකඟ වූයේ නැත. ක්‍රම ක්‍රමයෙන් මම ඔහුගේ සාහිත්‍ය ඔවදන්වලට සවන් දුනිමි. අවසානයේ ඔහු ඒ ඉල්ලීම බාරගෙන දින කිහිපයකින් ඔහුව මුණ ගැසෙන ලෙස දැන්වීය.

"මේක කෙටි කතා පොතක් නෙමෙයි. ඔයාට තාම කෙටිකතාව ගැන ඉගෙනගන්න දේවල් තියනවා. කෙටි කතා ලියන්න ඕනා අහවල් ලේඛකයා ලියනවා වගේ" ඔහු එදිනද පැවසුවේ හුස්ම විචාරයේදී ඔහු නම සඳහන් කළ ප්‍රවීන බත්මුල කියවූ ඔහු එය සාර්ථක කෙටි කතා නිර්මාණයක් බවත්, කිසිදු වෙනස්කමක් සිදු නොකර දිවයින ඉරිදා පුවත්පතේ එය පළ කරන බවටත් විද්‍යුත් තැපෑලෙන් පිළිතුරක් එවීය. එසේම දිගටම දිවයිනට කෙටිකතා ලියන මෙන් ඉල්ලීමක් ද කළේය. මා ලංකාවට ගිය විට ඔහු මුණ ගැසිණි. ඉතාමත් මිත්‍රශීලී, සහෘදයෙකු වූ හේ එදා දිවයින කන්තෝරුවේ ඔහුගේ සගයන්ට මා හඳුන්වා දුන්නේ "මේ ලක්ෂ්මන්. අර බත්මුලේ කතාව ලිව්වෙ මෙයා තමයි." කියමිනි. බත්මුල එතරම් පිරිසක් අතරට ගිය වග මා දැනගත්තේ එදිනය. ඉන්පසු මගේ කෙටි කතාවක් දිවයිනේ පළවූ අතර, දරුණු වකුගඩු ආසාදනයකට ගොදුරු වූ දොඩංගොඩයන් අසනීප තත්වය නිසා දිවයින පුවත්පතින් සමුගත්තේය. එහෙත් අප අතර සම්බන්ධතාවය එයින් නතර නොවිණි.

"මං නව කතාවක් ලියාගෙන යනවා. ලියලා ඉවරවුණාම එවන්නම්. කියවලා අදහස් දන්වන්න පුළුවන්ද ?" මම දුරකථනයෙන් ඇසීමි.

"මං හුඟාක් අසනීපෙන් ඉන්නේ ලක්ෂ්මන්. එවන්න. පුළු පුළුවන් විදියට කියවල පෙරවදනක් ලියලා එවන්නම්." ඔහු මට පැවසීය. එසේම මගේ පරාරෝපණය, යොවුන් නවකතාවේ අඩු ලුහුඬුකම් පෙන්වූ ඔහු එයින් හොඳ පණි විඩයක් සමාජයට ලබාදෙන බවත්, එය යොවුන් නවකතාවකට වඩා තරමක් වෙනත් ආරක කෘතියක් බවත්, නාට්‍යයේ රඟපෑවේය. හුස්ම මා ලියූ කෙටිකතාවෙන් නිර්මාණය කළ කෙටි නාට්‍යයකි. ඔහුගේ පුත් මාර්ගයෙන් හුස්ම නරඹා ඔහු එය කාලීන යුගයට ගැලපෙන සාර්ථක නාට්‍යයක් ලෙසින් අගය කළේය. නාට්‍ය කලාව ගැනද බොහෝ දෑ කතා කළේය.

ජගත් හා දොඩංගොඩ දෙපළ කෘතහස්ත මාධ්‍යවේදීන්ය. පහන් වැට තුළින් ලාංකික පාඨක ප්‍රජාව ග්‍රහණය කරගත් සාර්ථක නිර්මාණශීලී ලේඛක දෙපළකි. එහෙත් දෙදෙනා දෙවිදියකට හිතන පතන ලියන දෙදෙනෙකි. ඒ දෙදෙනාගෙන්ම මා ලබාගත් අදහස් අනුශාසනා බොහෝය. එයින්ද දොඩංගොඩයන් ප්‍රමුඛය. එහෙත් තම පෑනෙන් ලාංකීය සාහිත කෙත වපුරා අස්වැන්න අප අතර ඉතිරි කර දෙදෙනාම අපෙන් සඳහටම සමුගෙන ඇත.

